# විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය හා රැකවරණය පිළිබඳ පාඨමාලාව
# Certificate in Child Care & Therapy Assistant (Special Needs) – NVQ Level 4

| | |
|---|---|
| **පාඨමාලා කාලය** | මාස 12 ක් (ආයතනික පුහුණුව සඳහා මාස 6 ක් සහ රැකියා පුහුණුව සඳහා මාස 6 ක්) |
| **ආරම්භක දිනය** | 2025 ජනවාරි 25 වන දින |
| **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය** | **2025 ජනවාරි 07 වන දින** |
| **දින** | සතියකට දින දෙකක් හෝ තුනක් (අභිමතය පරිදි) - සෙනසුරාදා ද ඇතුළුව |
| **වේලාව** | පෙ.ව 8.00 - ප.ව 4.00 |
| **ගාස්තු** | අධ්‍යයන ගාස්තු - Rs. 80,000/-<br>**වාරික 4 කින් ගෙවිය හැකිය.**<br>ලියාපදිංචි කිරීමේ ගාස්තු: Rs. 2,000/-<br>පහසුකම් ගාස්තු: Rs. 2,500/-<br>පුස්තකාල පහසුකම් : Rs. 1,500/-<br>ප්‍රායෝගික පන්ති ගාස්තු: Rs. 12,000/-<br>**එකතුව: Rs. 98,000/-** |
| **පවත්වනු ලබන ස්ථානය** | **චිත්‍රා ලේන් ළමා සම්පත් මධ්‍යස්ථානය,** 45/3, **චිත්‍රා ලේන්, කොළඹ** 05 |

**කවුරුන් සඳහාද**

- අධ්‍යාපනඥයන් / ගුරුවරුන් සහ ගුරු සහයකයින්
- ළමා සුරැකුම් **මධ්‍යස්ථාන හිමිකරුවන් /ප්‍රධානීන්**
- **දරුවන් රැකබලාගන්නන්** / සමාජ සේවකයින්
- දෙමාපියන්
- දිවා සුරැකුම් ගුරුවරුන්/ දිවා සුරැකුම් සපයන්නන්

**අවම සුදුසුකම්**

- අ.පො.ස.සා.පෙළ සමත් විය යුතුය
- වයස අවුරුදු 18 ට වැඩිවිය යුතුය

**පාඨමාලාව සාර්ථකව නිම කළ පසු ඔබට** ශ්‍රී ලංකාවේ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් NVQ සහතිකයක් පිරිනමනු ඇත. එසේම **පහත රැකියාවල නියුතු වීමේ අවස්ථාව ඔබට ලැබෙනු ඇත.**

- විශේෂ අවශ්‍යතා පිළිබඳ අධ්‍යාපනඥයන්/ දිවා සුරැකුම් සහයකයින්/ පාසැල්/ ගෘහස්ථ ළමා දිවා සුරැකුම් සේවා සපයන්නන්.
- විශේෂ අවශ්‍යතා පිළිබඳ ගුරු භවතුන් / පරිපාලකයින්/ පාසැල්/ ගෘහස්ථ ළමා දිවා සුරැකුම් සේවා සපයන්නන්.
- විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා පාසල් වේලාවෙන් පසු සේවා සපයන්නන්.

මෙම සහතිකයෙන් මූලික අධ්‍යාපන අවශ්‍යතා පසුබිමක් තුළ අනුමත ඉගෙනුම් රාමුවක් ක්‍රියාත්මක කිරීමට සහාය වන මෙවලම් සහ දැනුම ඔබට ලබාගත හැක. මෙම සුදුසුකම් ඇති මුල් අධ්‍යාපනඥයන් සහ පහසුකම් සපයන්නන්ට සෘජු අධීක්ෂණය යටතේ හෝ ස්වාධීනව වැඩ කළ හැකිය.

## වැඩසටහන

මෙම පාඨමාලාව ශ්‍රී ලංකාවේ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටමේ (NVQ - Level 4) අවශ්‍යතාවයන්ට අනුකූල ව සකස්කර ඇත. මුල් ළමාවිය අධ්‍යාපන / ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල සියලුම දරුවන්ගේ සුවිශේෂී අවශ්‍යතා සපුරාලීමට මෙම සහතිකය ළමා දිවා සුරැකුම් ගුරුවරුන්ට සහ පහසුකම් සපයන්නන්ට ප්‍රායෝගික හා වෘත්තීය පුහුණුව ලබා දෙයි. විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අද්විතීය අවශ්‍යතා සපුරාලීම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇති ශක්තිමත්, අවිනිශ්චිත හා ප්‍රායෝගික කුසලතා ලබා ගැනීමට මෙම වැඩසටහන මඟින් ඔවුන්ට හැකියාව ලැබේ. මෙම පාඨමාලාවේ සුවිශේෂීත්වය වනුයේ සහභාගිවන්නන්ට, විශේෂ අවශ්‍යතා ඇති දරුවන් පිළිබඳ න්‍යායාත්මක දැනුම මෙන්ම ප්‍රායෝගික පුහුණුව ලබාගැනීමට අවස්ථාව හිමිවීමයි.

## පාඨමාලා අන්තර්ගතය

- සාමාන්‍ය දරුවෙකුගේ සංවර්ධනය සහ විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ සංවර්ධන ප්‍රමාදයන් කල්තියා හඳුනාගැනීම සහ මැදිහත්වීම, ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය හඳුන්වාදීම, ළමා සුරැකුම් මධ්‍යස්ථානවල සුරක්ෂිත යෝග්‍ය භෞතික පරිසරයක් නිර්මාණය කිරීම, ළමයාගේ පරිපූර්ණ සංවර්ධනය පිළිබඳ මූලික දැනුම හා අවබෝධය, දරුවාගේ සමාජ හා ජීවන කුසලතා වර්ධනය කිරීම, දරුවාගේ ප්‍රජානන, භාෂා සහ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම, සෞන්දර්යාත්මක හැකියාවන් සහ පාරිසරික දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා මාර්ගෝපදේශය, ශාරීරික අධ්‍යාපනය සහ මාර්ගෝපදේශය සියුම් සහ දළ චාලක කුසලතා වර්ධනය, සිගිත්තන් සහ බිළිඳුන් සඳහා රැකවරණය සැලසීමට අදාල අවශ්‍ය දැනුම සහ කුසලතා, සාමාන්‍ය ළමාරැකවරණය, ආබාධිත දරුවන්ට රැකවරණය ලබාදීම සහ ළමයින්ට ප්‍රතිචාර දැක්වීම, ළමයින් සඳහා වයසට යෝග්‍ය සෞඛ්‍ය හා පෝෂණ අවශ්‍යතා ඉටුකරගැනීමට පහසුකම් සලසාදීම, ළමා ආරක්ෂාව පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ සකස් කිරීම, ළමා සුරැකුම් මධ්‍යස්ථාන පරිපාලන කටයුතු ක්‍රියාත්මක කිරීම , විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා ප්‍රජා පාදක මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම , කණ්ඩායම් වැඩ, වෘත්තීය සෞඛ්‍යය, ඉංග්‍රීසි විෂය , තොරතුරු තාක්ෂණ විෂය
- තක්සේරු: සියලුම පුහුණුවන්නන් විසින් පාඨමාලාවට අදාළ සෑම ලිඛිත පරීක්ෂණ, භූමිකා රංගන, තක්සේරුකරුවන්ගේ නිරීක්ෂණ, පාසැල් පාදක ඉලක්ක සාර්ථකව කළ යුතුය.
- පාඨමාලාව ඉගැන්වීමේ මාධ්‍යය: සිංහල / ඉංග්‍රීසි

## චිත්‍රා ලේන් තෝරාගැනීමේ ප්‍රතිලාභ

**චිත්‍රා ලේන් ළමා සම්පත් මධ්‍යස්ථානයේ අධ්‍යාපන හා ප්‍රතිකාරාත්මක වැඩසටහන් නිර්මාණය කර ඇත්තේ, විශේෂ අවශ්‍යතා ඇති ළමුන්ගේ පුද්ගල වෙනස්කම් ක්‍රමානුකූලව අධීක්ෂණයට ලක් කරන ලද ඉගැන්වීම් පිළිවෙත්, අනුගමනය කරමින්ය. අනුවර්තනය කරන ලද උපකරණ සහ විශේෂ අවශ්‍යතා සහිත ඉගෙන ගන්නන්ට ඉහළ මට්ටමේ පෞද්ගලික ප්‍රතිලාබ සහ සාර්ථකත්වයක් ළඟා කර ගැනීම සඳහා නිර්මාණය කර ඇති මැදිහත්වීම් මෙහි අන්තර්ගත වේ.**.

- විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සමඟ වැඩ කිරීමේ වසර 55 කට වැඩි අත්දැකීම
- බහුවිධ ඉගෙනුම් පරිසරය
- ශ්‍රී ලංකාවේ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පුහුණු ආයතනයක් ලෙස ලියාපදිංචි වී ඇත (Reg. No. P01/0763).
- **මෙය විශේෂ අවශ්‍යතා පිළිබඳ ශ්‍රී ලංකාවේ මුල්ම TVEC ප්‍රතීතනය ලත් පාඨමාලාව වේ.**

**අමතන්න: 071 5285200 (බුද්ධි) හෝ 0777 038375**

වැඩි විස්තර සඳහා **www.chitralane.lk** වෙත පිවිසෙන්න.